**දමන ප්‍රාදේශීය සභාව.**

**අම්පාර දිස්ත්‍රික්කය**

**-------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හිඟහිටි ආදායම් ලේඛනය අනුව හිඟ හිටි කුළී රු.393,147 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වල එය රු.403,902 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ආදායම රු.10,755 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) හිඳකළුගම මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.150,000 ක් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

(ඇ) රු.මිලියන 2.5 ක කර්මාන්ත ණය හිමියෝ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) සභාව සතු ඔරු 02 ක් හා බෝට්ටුවක් කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබාදීම වෙනුවෙන් වූ රු.469,000 ක ලැබිය යුතු ආදායම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

**1.3.2 ගෙවිය යුතු ගිණුම්**

**-------------------**

2010 වර්ෂයේ සිට දිගින් දිගටම පැවත එන එකතුව රු.363,800 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.233,722 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය.

## 1.3.4 අනුකූල නොවීම්

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම් |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය | 83,750 | ඉකුත් වර්ෂයේ සිට ගිණුම්වල පෙන්වා ඇති හිඟහිටි වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා රීති 180 හා 181 | - | සභාවේ ආදායම් එකතු කිරීම, ගබඩා පාලනය, චෙක්පත් නිකුත් කිරීම වැනි රාජකාරී වලට අදාල නිලධාරීන් විසින් ඇප මුදල් තැන්පත් කර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 104 හා මුදල් රෙගුලාසි 105 | - | සභාවට අයත් කැබ් රථයක් 2009 නොවැම්බර් 17 දින අනතුරකට ලක්වීමෙන් පසු අලුත්වැඩියාව සඳහා පෞද්ගලික ගරාජයකට යොමු කර තිබුණද, මුදල් රෙගුලාසි 104 අනුව මෙම අනතුර සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැනගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම හා මුදල් රෙගුලාසි 105 අනුව අලාභ හානි සම්බන්ධයෙන් අයකරගත හැකි උපරිම අගයන් තීරණය කිරීම සිදුකළ යුතු වුවත්, සභාව විසින් ඊට පටහැනිව කටයුතු කර තිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 | | සභාව සතු වාහන 04 ක් සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,941,878 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,499,342 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් සහ හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල් කළ ආදායම | රැස්කළ රු ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 420,906 | 420,907 | 87,672 | 1,711,451 | 420,000 | 420,906 | 284,300 | 1,378,839 |
| (ii) කුලී ආදායම් | 472,626 | 2,975,376 | 3,038,364 | 403,902 | 2,586,626 | 493,626 | 2,696,134 | 537,330 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,222,184 | 1,345,000 | 1,630,654 | 83,750 | 1,570,400 | 509,330 | 1,558,340 | 83,750 |
| (iv) වෙනත් ආදායම් | 3456,983 | 1,222,500 | 258,091 | 1,415 | 3,390,832 | 3,869,345 | 195,853 | 1,415 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාව විසින් 2017 දෙසැම්බර් 31 දිනට අයකළ යුතු මුළු ආදායම රු.7,574,033 ක් වූ අතර වර්ෂය තුල රු.5,014,781 ක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ආදායම් රැස් කිරීම සියයට 66 ක මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.3 වරිපනම් හා බදු

2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී වරිපනම් අය කර තිබුණි. වරිපනම් ලේඛනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.1,480,601 ක් වූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කුලී

2017 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ කුලී ආදායම් රු.403,902 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

2017 දෙසැම්බර් 31 දිනට පැවති නොගෙවූ බලපත්‍ර ගාස්තු රු.83,750 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

### 2.2.6 වෙනත් ආදායම්

සභා බල ප්‍රදේශයේ දුරකථන කුළුණු 12 ක් පැවති අතර 2009 අප්‍රේල් 19 දිනැති අංක 1597/8 දරන ගැසට් පත්‍රය ප්‍රකාරව දුරකථන කුළුණු සඳහා අවම වශයෙන් එක් කුළුණකට රු.20,000 ක් බැගින් රු.240,000 ක මූලික ගාස්තුවක් අයකර නොතිබුණි.

**2.3.7** මුද්දර ගාස්තු

-------------

2017 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාගෙන් මුද්දර ගාස්තු වශයෙන් රු.132,150 ක් ලැබිය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1** **කාර්යසාධනය**

-----------------

**3.1.1** අතහැර දැමූ කර්තව්‍යන්

---------------------------

ඉකුත් වර්ෂයන් තුල දී කර්තව්‍යන් 2 ක් ආරම්භකර ඒ සඳහා රු.1,480,667 ක් වැය කර තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබානොගෙන එම කාර්ය අත්හැර දමා තිබුණි.

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ළමා උද්‍යානය සතිපොළ භූමියේ පිහිටා තිබෙන අතර, සතිපොළ පැවැත්වීමෙන් පසු ළමා උද්‍යානය ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයකට පත්වන බව නිරීක්ෂණය විය. රු.මිලියන 3.3ක් වැයකර ඉදිකර තිබුණු මෙම ළමා උද්‍යානය ස්ථාපනයේදී මෙම ගැටළු පිළිබඳ අවධානය යොමු නොකිරීම නිසා මෙවැනි තත්ත්වයක් ඇති වී තිබුණි.

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් ළමා උද්‍යානයේ රු.මිලියන 1.8 ක් වටිනා ක්‍රීඩා උපකරණ සවිකර තිබුණ ද, ඒවායේ ආරක්ෂාව මෙන්ම එහි නඩත්තු කටයුතු සඳහා සුදුසු භාරකරුවෙකු පත්කර නොතිබීම නිසා ක්‍රීඩාංගනයේ පැවැත්ම අවිනිශ්චිත තත්වයක පැවතුණි.

(ඇ) 2016 අගෝස්තු මාසයේදී සභාව විසින් රු.254,292 ක් වැයකර මාළු හා මස් වෙළඳාම් කිරීමට හිඟුරාණ සතිපොළ භූමියේ කඩ ඉදිකර තිබිය දී සතිපොළ භූමියේ වෙනත් ස්ථානවල මාළු හා මස් විකිණීම සිදුකරන බව දක්නට ලැබුණු අතර, මේ සම්බන්ධයෙන් සභාව විසින් විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සභාව සතු වාහන 07 ක් සඳහා ආදායම් බලපත්‍ර අදාල වර්ෂයේදී ලබා නොගැනීම නිසා දඩ මුදල් වශයෙන් පිළිවෙලින් රු.4,190 ක් හා රු.5,000 ක් 2016 හා 2017 වර්ෂ වල ගෙවා තිබුණි.

(ඉ) සභාව සතු ඔරු 02 ක් 2009 නොවැම්බර් 13 දින පුද්ගලයන් දෙදෙනෙකුට රු.1,500ක මාසික කුලී පදනම මත ලබාදී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට සභාවට ලැබිය යුතු කුලිය රු.291,000 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ii) මෙම ඔරු 02 කුලියට දීමට අදාලව පිළියෙල කල ගිවිසුම් වල සාක්ෂිකරුවන් දෙදෙනෙකු හා සභාවේ සභාපති අත්සන් කර නොතිබූ බැවින්, කුලී ආදායම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි

(iii) කුලී ගිවිසුම අනුව අදාල කුලිය ගෙවීම පැහැර හැරියහොත් මෙම ඔරු සභාව වෙත පවරාගත යුතු වූවත්, එසේ පවරාගැනීම සිදුකර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක් සඳහා පුරප්පාඩු 10 ක් පැවතුණි.

(ආ) සභාවට අයත් හිඟුරාණ කායවර්ධන මධ්‍යස්ථානය සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවාගෙන ඇති අතර, ඉන් එක් අයෙකු අම්පාර නගර සභාවෙන් එක් දිනක් නිදහස් කර දී ඇතත්, බඳවාගන්නා ලද අනෙක් සේවකයා විධිමත් බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව බඳවාගෙන වැටුප් ගෙවා තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---------------------------------------

හිඟුරාන පිහිටි කඩ කාමර 13 කින් කඩකාමර 08 ක් බදු ගිවිසුමට පටහැනිව වර්ෂ 17 ක කාලයක සිට අතුරු බදු දී තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

---------------------------

**3.5.1 නඩත්තු හා අලුත්වැඩියා නොකිරීම**

--------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු අළුත්වැඩියා කළයුතු මට්ටමේ පැවති වාහන 05 ක් දීර්ඝ කාලයක් තිස්සේ අළුත්වැඩියාවකින් තොරව පැරණි සභා ගොඩනැගිලි පරිශ්‍රයේ ගාල්කර තිබුණි.එම වාහන අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) සභාව විසින් නඩත්තු කෙරෙන දමන හා මඩවලලන්ද ක්‍රීඩා පිටි දෙක වල් බිහි වී තිබූ අතර, ක්‍රීඩා පිටිවල නාම පුවරු සවිකර නොතිබුණි.

**3.5.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් නොලැබීම**

------------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) හිඟුරාන පිහිටි කඩ කාමර 13 කින් 06 ක් හා මුවංගල කඩ කාමර 12 කින් 03 ක් වර්ෂ 01 සිට වර්ෂ 15 ක් දක්වා වසා දමා තිබූ අතර, අයවිය යුතු රු.220,239 ක හිඟ කුළී අයකර කර ගැනීමට හෝ එම කඩකාමර නැවත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු බෝට්ටුවක් 2010 ජූලි 28 දින පුද්ගලයකුට රු.2,000 ක මාසික කුලියක් මත බදු දී තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ අවසනයට සභාවට ලැබිය යුතු රු.178,000 ක කුළී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) මෙම බෝට්ටුව කුලියට දීමට අදාලව පිලියෙල කල ගිවිසුම් වල සාක්ෂිකරුවන් දෙදෙනෙකු හා සභාවේ සභාපති අත්සන් කර නොතිබූ බැවින්, කොන්දේසි කඩවීම සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී තිබුණි.

**3.5.3 පවරා නොගත් වත්කම්**

**------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විවිධ ආයතන මඟින් සභාවට ලබාදුන් වාහන 12 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ඉඩම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි.

**3.6 ප්‍රසම්පාදනය**

**--------------**

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------**

2006 මාර්තු 24 දින නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ අංක 128 අනුව සභාව විසින් 2017 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**-------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-----------------**

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය වියදම අතර සියයට 3 සිට සියයට 81 දක්වා පරාසයක විචලනයක් පැවති බැවින් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලනය**

**-------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කල යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | - | i. හිඟ ආදායම් අයකර නොගැනීම.<br>ii. අතුරු ව්‍යවස්ථා පනවා නොතිබීම.<br>iii. ආදායම් ප්‍රභව හඳුනා නොගැනීම. |
| (ආ) | අයවැය පාලනය | - | අයවැය නිසිලෙස පිළියෙල කර නොතිබීම. |
| (ඇ) | ගබඩා පරිපාලනය | - | භාණ්ඩ ගබඩා කිරීම නිසි පරිදි සිදු නොවීම. |
| (ඈ) | වත්කම් පාලනය | - | ස්ථාවර වත්කම්වල අයිතිය පවරා නොගැනීම. |
| (ඉ) | ගිණුම්කරණය | - | වත්කම් ගිණුම්ගත කර නොතිබීම. |